# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

විභාග අංකය/නම : ..........................................

| 10 ශ්‍රේණිය | II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

සැලකිය යුතුයි :

- පළමු ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න 2ක් ද II කොටසෙන් ප්‍රශ්න 2ක් ද

  ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අනූෂා නානායක්කාර වාණිජ අංශයෙන් උසස් පෙළ හදාරා ප්‍රතිඵල අපේක්ෂාවෙන් නිවසේ ගත කරයි. ඇයගේ මව රස කැවිලි සාදා විකුණමින් සිටින්නීය.

නිතර නිතර මවට ලැබෙන රස කැවිලි ඇනවුම් ඉහළ ගියද එම ඇනවුම් සම්පූර්ණ කිරීමට මවට නොහැකි වන ආකාරය දුටු අනූෂා, ඇයගේ සහෝදරියකගේද සහය ඇතිව රස කැවිලි නිෂ්පාදනය කර අලෙවි කිරීම සඳහා නිවසේ කොටසක ව්‍යාපාරයක් ඇරඹීමට තීරණය කරන ලදී.

ඒ අනුව 2024/06/01 දින අනූෂා ඉතිරි කරගත් රු. 200,000/= ද මවගේ රු.100,000ක මුදලක්ද යොදා " අනූෂා රස කැවිලි නිෂ්පාදකයෝ" නමින් ව්‍යාපාරයක් ඇරඹීය.

අනූෂාත් ඇයගේ සහෝදරියද කුඩා කල සිට කොන්ඩ කැවුම්, අතිරස, පැණි වළලු හා අළුවා සෑදීමට ඉතා දක්ෂ සොයුරියන්ව බව වඩාත් ප්‍රසිද්ධ වී තිබුණි. ඇයගේ නිවස ප්‍රධාන මාර්ගය ආසන්නයේ පිහිටා තිබීමත්, රස කැවිලි පිරිසිදු හා රසවත් වීම නිසාත් පාරිභෝගික ඉල්ලුම ඉහළ යමින් තිබේ.

එම ව්‍යාපාරයේ ජුනි මාසයේ සිදුවූ ගනුදෙනු පහත දැක්වේ.

06/02 - රු.200,000/= ක බැංකු ණයක් ලබාගැනීම.

06/03 - සහල් කෙටීම සඳහා රු.200,000/= වටිනා යන්ත්‍රයක් මිලදී ගැනීම.

06/04 - රු.50,000/= වටිනා සුදු සහල් මිලදී ගැනීම.

06/05 - රු.25,000/= වටිනා පොල්තෙල් මිලදී ගැනීම.

06/10 - රු.45,000/= ක් රසකැවිලි අලෙවියෙන් මුදල් ලැබීම.

06/15 - රු.10,000/= ක විදුලි බිල ගෙවීම.

06/20 - රු.15,000/= ක් රක්ෂණ ගාස්තු ගෙවීම.

06/25 - රු. 25,000/=ක සහල් තොගයක් ණයට ගැනීම.

I. අ) මෙම ව්‍යාපාරය සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාවය කුමක්ද? (ල.01)

ආ) එම අවශ්‍යතා සපුරාලීම සඳහා සිද්ධියේ සඳහන් වුවමනාවන් දෙකක් ලියන්න. (ල.01)

II. අ) ‘අනූෂා රස කැවිලි නිෂ්පාදකයෝ’ව්‍යාපාරය අයිතිය අනුව වර්ග කිරීමේදී අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද? (ල.01)

ආ) අරමුණු අනුව වර්ග කරන්නේ නම් මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත් වන්නේද? (ල.01)

III. අ) ඉහත ‘අනූෂා රස කැවිලි නිෂ්පාදකයෝ’ ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුද? ඊට හේතු දක්වන්න. (ල.01)

ආ) එම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු බලධාරියා කවුද? (ල.01)

IV. අ) මෙම සිද්ධියට අනුව ව්‍යාපාරයේ ශක්තියක් හා අවස්ථාව බැගින් ලියන්න. (ල.01)

ආ) මෙම ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශ්ව දෙකක් දක්වා උදාහරණය බැගින් ලියන්න. (ල.01)

V. 2024/06/01 දිනට මෙම ව්‍යාපාරය ගිණුම්කරණ සමීකරණය වටිනාකම් සහිතව ලියන්න. (ල.02)

VI. 2024/06/20 දිනට අදාළ ගනුදෙනුවේ ද්විත්ව සටහන ලියන්න. (ල.02)

VII. ඉහත ව්‍යාපාරය ගනුදෙනු සටහන් කිරීම සඳහා භාවිතා කෙරෙන මූලික සටහන් පොතක් හා මූලාශ්‍ර ලේඛනයක් දක්වන්න. (ල.02)

VIII. අනූෂා රස කැවිලි නිෂ්පාදකයන්ගේ ජුනි මාසයට අදාළ මුදල් පොත සාදා අත ඉතිරිය දක්වන්න. (ල.02)

IX. 2024/06/30 දිනට වත්කම් දෙකක් අගයන් සහිතව ලියන්න. (ල.02)

X. 2024/06/30 දිනට එම ව්‍යාපාරයේ මුළු වගකීම්වල වටිනාකම කොපමණද? (ල.02)

I කොටස

(ප්‍රශ්න 2කට පමණක් පිළිතුරු සපයන්න.)

02. I. අ) ව්‍යාපාරයක් යන්න හඳුන්වන්න. (ල.01)

ආ) වුවමනාවල ලක්ෂණ දෙකක් ලියන්න. (ල.01)

II. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න. (ල.02)

අ) වුවමනාවන් පුද්ගලයින් ජීවත් වන රට අනුවද වෙනස් වේ.

ආ) සෑම ව්‍යාපාරයක්ම කටයුතු කරන්නේ ලාභ ලැබීමේ අරමුණිනි.

ඉ) "සිල්ලර වෙළෙඳ ආයතන" සේවා සැපයීමේ ආයතන වලට උදාහරණයක් වේ.

ඊ) වගා කටයුතු සිදු කරන ව්‍යාපාරයක වගාවෙන් නෙලා ගන්නා පළතුරු,භූමිය යටතට ගැනේ.

III. ඇල්මැති පාර්ශවයක් ලෙස රජය විසින් ඉටුකර ගැනීමට අපේක්ෂා කරන අරමුණු දෙකක් ලියා දක්වන්න. (ල.02)

IV. නිෂ්පාදන සාධක අතරින් ඉතාමත් වැදගත් නිෂ්පාදන සාධකයක් වන්නේ ව්‍යවසායයි. මෙහිදී ව්‍යවසායකයා විසින් ඉටු කරනු ලබන කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (ල.02)

03. I. අ) ඔබේ පාසලේ බාහිර පරිසරය තුළ දක්නට ලැබෙන පාර්ශ්ව දෙකක් සඳහන් කරන්න. (ල.01)

ආ) අභ්‍යන්තර හා බාහිර පරිසරය අතර දක්නට ලැබෙන වෙනස්කම් දෙකක් ලියා දක්වන්න. (ල.01)

II. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ) අභ්‍යන්තර පරිසරයේ බලපෑම් ව්‍යාපාරයට පාලනය කළ හැක.

ආ) රටවල් අතර ඇතිවන යුදමය තත්ත්වයන්, භාණ්ඩ අපනයන ව්‍යාපාරයට අවස්ථාවකි.

ඉ) ගෝලීයකරණය හේතුවෙන් ව්‍යාපාර ලෝකය, විශ්ව ගම්මානයක් ලෙස ඒකරාශී වී තිබේ.

ඊ) කෘතිම බුද්ධි භාවිතය ඉහළ යාම, තාක්ෂණික පරිසරයේ කැපී පෙනෙන ප්‍රවණතාවයකි. (ල.02)

III. නෛතික පරිසරයේ ඇතුළත් වන අණ පනත් හා නීතිරීති පැනවීමෙන් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු දෙකක් ලියන්න. (ල.02)

IV. කෘතිම බුද්ධිය (AI), නැනෝ තාක්ෂණය, රොබෝ තාක්ෂණය යනාදියේ ශීඝ්‍ර සංවර්ධනය ව්‍යාපාර කටයුතු වඩාත් කාර්යක්ෂම හා පහසු කර තිබේ. කෙසේ වෙතත් තාක්ෂණික පරිසරයේ ශීඝ්‍ර වෙනස්කම් ව්‍යාපාරවලට අවාසිදායක තත්ත්වයන් ද ඇතිකර තිබේ. එසේ ඇති වී තිබෙන අවාසිදායක තත්ත්වයන් දෙකක් සඳහන් කරන්න. (ල.02)

04. I. අ) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේදී යොදා ගන්නා නිර්ණායක දෙකක් සඳහන් කරන්න. (ල.01)

ආ) මහා පරිමාණ ව්‍යාපාර සංවිධානවල දක්නට ලැබෙන පොදු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල.01)

II. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, රාජ්‍ය දෙපාර්තමේන්තුවකට උදාහරණයකි.

ආ) හවුල් ව්‍යාපාරයකට ව්‍යාපාරයේ නමින් වාහන මිලදී ගත හැක.

ඉ) හවුල් ව්‍යාපාරයක සිටිය හැකි උපරිම සාමාජික සංඛ්‍යාව,1890 හවුල් ආඥා පනතේ නිශ්චිතව සඳහන් කර ඇත.

ඊ) පොදු හෝ විශේෂ පනතක් යටතේ, රාජ්‍ය සංස්ථා පිහිටවනු ලැබේ. (ල.02)

III. අනෙකුත් ව්‍යාපාර සංවිධාන වලට සාපේක්ෂව සංස්ථාපිත සමාගම්වල දක්නට ලැබෙන වාසි දෙකක් ලියා දක්වන්න. (ල.02)

IV. ඒක පුද්ගල ව්‍යාපාරයක ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල.02)

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

05. I. අ) 'ගිණුම්කරණය' යනු කුමක්දැයි හඳුන්වන්න. (ල.01)

ආ) වගකීමක ලක්ෂණ දෙකක් ලියන්න. (ල.01)

II. පහත ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න.

අ) අයිතිකරුගේ පෞද්ගලික දුරකථන බිල රු.5000/= ව්‍යාපාරයේ මුදලින් ගෙවීම.

ආ)රු.40,000/= වටිනා භාණ්ඩ තොගයක් ණයට ගැනීම.

(ල.04)

III. අ) 2025 ජනවාරි මාසයට අදාළව පියල්ගේ ලීබඩු වෙළෙඳ ව්‍යාපාරය ගනුදෙනු කිහිපයක් ඔබට දී ඇත.

A. රු.600,000 ක ප්‍රාග්ධනය යෙදවීම.

B. රු.200,000 ක් වටිනා ලී බඩු අත්පිට මුදලට ගැනීම.

C. රු.50,000 වටිනා ලී බඩු රු. 70,000කට ණයට විකිණීම.

D. රු.100,000 ක බැංකු ණයක් ලබා ගැනීම.

E. රු. 10,000 ක විදුලි ගාස්තු ගෙවීම.

ඉහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට ඇති කරන බලපෑම ලියා දක්වන්න.

ඒ සඳහා පහත ආකෘතිය භාවිතා කරන්න. පළමු ගනුදෙනුව ඔබට ලබා දී ඇත.

| ගනුදෙනුව | වත්කම් | | = | හිමිකම්. + | වගකීම් |
|---|---|---|---|---|---|
| | ණයගැති<br>රු. | තොගය<br>රු. | මුදල්<br>රු. | ප්‍රාග්ධනය<br>රු. | බැංකු ණය<br>රු. |
| A | | | + 600 000 | + 600 000 | |
| B | | | | | |
| C | | | | | |
| D | | | | | |
| E | | | | | |

(ල.04)

ආ) 2025/ 01/ 31 දිනට පියල්ගේ ව්‍යාපාරයේ ගනුදෙනුවලින් පසු වටිනාකම් සහිතව ගිණුම්කරණ සමීකරණය ලියන්න.

(ල.02)

06. I. මුදල් පොතෙන් ඉටුවන ද්විත්ව කාර්යයන් මොනවාද ? (ල.02)

II. වෙළඳ වට්ටම හා මුදල් වට්ටම අතර වෙනස දක්වන්න. (ල.02)

III. පහත දැක්වෙන්නේ සමාරාගේ ව්‍යාපාරයේ 2025 ජනවාරි මාසයේ සිදුවූ ගනුදෙනුය.

මුදල් පොතේ ශේෂය රු.80,000කි.

(a) 2025/01/01 බැංකු ණයක් ලබාගැනීම. රු. 500 000 (ල.අං. 01)
(b) 2025/01/05 අත්පිට විකුණුම් රු. 65,000 (ල.අං. 02)
(c) 2025/01/10 අත්පිට ගැනුම් රු. 40,000 (ව.අං. 01)
(d) 2025/01/12 ණයගැතියකු වූ අමල්ගෙන් 10%ක මුදල් වට්ටමකට යටත්ව මුදල් ලැබුණා. රු.4500 (ල.අං. 03)
(e) 2025/01/15 ණයට ගැනුම් - කවිෂ්ක රු.15,000
(f) 2025/01/17 සුනිමල්ට ගෙවීමට තිබූ රු.12,000ක ණය මුදල පියවීමේදී 5%ක වට්ටමක් හිමි විය. (ව.අං. 02)
(g) 2025/01/20 විදුලි බිල ගෙවීම. රු.3500 (ව.අං. 03)
(h) 2025/01/22 ණය වාරිකය ලෙස රු.7000ක් ගෙවූ අතර එහි ඇතුලත් ණය පොලිය රු.1500කි. (ව.අං. 04)

අවශ්‍ය වන්නේ,

සමාරාගේ ව්‍යාපාරයේ 2025/01/31 දිනට වට්ටම් තීරු සහිත මුදල් පොත පිළියෙල කිරීම. (ල.08)

(07) I. අ) සුළු මුදල් පොත යනු කුමක්ද? (ල.01)

ආ) සුළු මුදල් පොතේ ගෙවීන් වාර්තා කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර ලේඛනය කුමක්ද? (ල.01)

II. කවිදුගේ ව්‍යාපාරයේ රු. 1800ක සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීමට අදාල ද්විත්ව සටහන වට්නාකම් සහිතව දක්වන්න. (ල.02)

III. උමයංගනගේ ව්‍යාපාරයේ 2025/06/07 දිනෙන් අවසන් වූ පළමු සතිය තුළ සිදු වූ සුළු වියදම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| 06/01 | සුළු මුදල් ශේෂය රු.500කි.<br>සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කළා. |
| 06/02 | මුද්දර ගාස්තු රු. 280 කි. |
| 06/03 | හංසිට ගෙව්වා. රු.200කි.<br>සංග්‍රහ වියදම් රු. 120කි. |
| 06/04 | පැන් මිලදී ගැනීම රු. 150 කි.<br>ගමන් වියදම් රු. 120කි. |
| 06/05 | ගනක යන්ත්‍රයක් මිලට ගැනීම රු. 700කි.<br>තැපැල් වියදම් රු. 200කි. |
| 06/07 | ලිපි ද්‍රව්‍ය වියදම් රු. 350 |
| 06/08 | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණ කළා. |

<u>අමතර තොරතුරු</u>

- සතියක කාලයක් සඳහා ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය **රු. 2500 කි.**
- “සංග්‍රහ, ලිපි ද්‍රව්‍ය, තැපැල්, විවිධ” යන විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් පොතක් පවත්වාගෙන යාම ව්‍යාපාරය සම්ප්‍රදාය වේ.

<u>අවශ්‍ය වන්නේ</u>

අ) උමයංගනගේ ව්‍යාපාරයේ 2025/06/07 දිනෙන් අවසන් පළමු සතිය සඳහා සුළු මුදල් පොත සකස් කරන්න. (ල.05)

ආ) සුළු මුදල් පොතේ වියදම් පිටපත් කරමින් ලේජර ගිණුම් සකස් කරන්න.

(ලෙජර ගිණුම් තුලනය කිරීමට අවශ්‍ය නැත.) (ල.03)